## අද ඔබ නිරෝගී කාන්තාවක්,

හෙටත් එසේ නිරෝගීව සිටීම ඔබේ ප්‍රාර්ථනාව වන බව නිසැකයි.

## එහෙත් ඔබ දන්නවාද?

- ඔබ වැනි ශ්‍රී ලාංකික කාන්තාවන් අතර සුලබම පිළිකා තත්වය වන **පියයුරු පිළිකාවෙන්** වර්ෂයකට **1000** ක් මියයන බව

- ශ්‍රී ලාංකික කාන්තාවන් අතර දෙවන සුලබම පිළිකා තත්වය වන **ගැබ්ගෙළ පිළිකාවෙන්** වර්ෂයකට කාන්තාවන් 700 ක් පමණ මිය යන බව

## එසේම ඔබ දන්නවාද?

අප ශ්‍රී ලාංකිකයන් 100 දෙනකු අතරින්

- 15 දෙනකු දියවැඩියාවෙන්
- 20 දෙනකු අධික රුධිර පීඩනයෙන් පෙළෙන බව

යම් ලෙසකින් මෙවැනි රෝග තත්වයක් ඔබටද වැළඳුනහොත්, සුවපත් අනාගත ජීවිතයක් පිළිබඳව වූ ඔබගේ ප්‍රාර්ථනා බිඳ වැටේවිද?

## එහෙත් එය එසේ වියයුතු නැත

මෙම සියළුම රෝග තත්වයන්ගෙන් වැළකීමට හෝ යම් ලෙසකින් දැනටමත් එවැනි රෝග තත්වයක් ඇත්නම් එය මුල් අවධියේ හඳුනාගෙන පාලනය කර ගැනීමට හෝ ඔබටම අවස්ථාව සැලසී ඇත.

ඒ සඳහා ඔබ කළ යුත්තේ ඔබගේ **සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය** මගින් පවත්වන **සුවනාරි සායනයට** පැමිණ එහි සේවාව ලබා ගැනීමයි.

සුවනාරි සායනයේදී සෞඛ්‍ය කාර්ය මණ්ඩලය ඔබව පරීක්ෂා කර බලා යම් රෝග තත්වයක් ඇතිනම් හෝ එවැන්නක් පිළිබඳ අනාගත අවදානමක් පවතින බව පෙනේ නම් එම රෝග තත්වය

- වළක්වා ගැනීමට
- මුල් අවධියේ හඳුනාගැනීමට
- සුව කිරීමට
- පාලනය කිරීමට

අවශ්‍ය ක්‍රියා මාර්ග, ප්‍රතිකර්ම සහ උපදෙස් **නොමිලයේම** සපයනු ඇත.

## සුවනාරි සායනයෙන් සැලසෙන සේවාවන්.........





01 සාමාන්‍ය කායික පරීක්ෂාව සහ **රුධිර පීඩනය** මැනීම



02 දියවැඩියාව රෝගය සඳහා **රුධිර ගත සීනි** පරීක්ෂා කිරීම



03 **පෝෂණ තත්වය** (BMI) බැලීම